- **නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූවෝ**

**ආචාර්ය වජිරා චිත්‍රසේන මහත්මිය**



1932 මාර්තු මස 15 වන දින උපත ලද වජිරා මහත්මිය ශ්‍රී ලංකාවේ කිහි වූ නර්තන ශිල්පිනියක ලෙස කිරුළු පලදා සිටින්නී ය. චිත්‍රසේන මහතාගේ දයාබර බිරිය වූ මෙතුමිය නර්තනය තම ජීවන වෘත්තිය ලෙස තෝරා ගත්තා ය.

1944 ආරම්භ කළ චිත්‍රසේන කලායතනය නර්තන ශිල්පීන් මෙන් ම උසස් නර්තන කලා නිර්මාණ බිහි වූ ආයතනයකි. චිත්‍රසේන මහතාගෙන් නර්තනය හැදෑරූ ඇය එහි ජ්‍යෙෂ්ඨ නර්තන ශිල්පිනිය වූවා ය. අවු. 19 දී **කුමුදුනී** මුද්‍රා නාට්‍ය නිෂ්පාදනය කරමින් ළමා මුද්‍රා නාට්‍ය කලාවක් හඳුන්වා දීමේ ගෞරවය ද ඇයට හිමි වෙයි. එමෙන් ම **රන් කිකිළි, ගිනි හොරා, හපනා, සේපාලිකා** යන මුද්‍රා නාට්‍ය නිෂ්පාදනය කරමින් ප්‍රේක්ෂකයන් අතර, ජනාදරයට ද ලක් වූවා ය.

එකල උඩරට කාන්තා රංග වස්ත්‍රාභරණ කට්ටලය වූයේ වෙස් ඇඳුම හා සමානකම් දක්වන ඇඳුම් කට්ටලයකි. එය කාන්තාවනට නුසුදුසු නිර්මාණශීලී බවින් යුක්ත ඇඳුම් කට්ටලයක් ලෙස සකස් කිරීමට ඇය පුරෝගාමී වූවා ය. ඒ සඳහා ඇයට සහයෝගය ලබා දුන්නේ සෝමබන්දු විද්‍යාපති මහතා ය.

උඩරට නැටුමේ තාණ්ඩව ලක්ෂණවලට ලාස්‍ය ලක්ෂණ මුසු කරමින් කාන්තාවට උචිත නර්තන විලාසයන් ඔප් නැංවෙන පරිදි ප්‍රසංග වේදිකාවේ නර්තන ඉදිරිපත් කිරීමට ද ඇය සමත් වූවා ය.

1949 දී චිත්‍රසේන මහතා රචනා කළ රාවණා මුද්‍රා නාට්‍යය සඳහා පූජා නර්තනයෙන් මෙන් ම කරදිය, නල දමයන්ති මුද්‍රා නාට්‍ය සඳහා නර්තනයෙන් ද දායකත්වය දක්වූවා ය. කරදිය මුද්‍රා නාට්‍යයේ සිසිගේ චරිතය සහ නල දමයන්ති මුද්‍රා නාට්‍යයේ හංස ධේනුවගේ චරිතයට නර්තනයෙන් පණ පොවමින් ඇගේ නර්තන ප්‍රතිභාව ලොවට හෙළි කිරීමට සමත් වූවා ය.

**ආචාර්ය මිරැන්ඩා හේමලතා මහත්මිය**



දේශිය නර්තන කලාවට සුවිශේෂ මෙහෙවරක් ඉටු කළ මිරැන්ඩා හේමලතා මහත්මිය, 1938 නොවැම්බර් මස 15 වන දින කැලණියේ දළුගම ග්‍රාමයේ උපත ලැබුවා ය. පාසල් අධ්‍යාපනයෙන්

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

පසු රජයේ ලලිත කලායතනයෙන් නර්තන අධ්‍යාපනය හැදෑරූ ඇය කොළඹ ක්‍රමය යටතේ ශිෂ්‍යත්වයක් හිමි කර ගනිමින් භාරතයට ගොස් අඩයාර්හි "කලා ක්ෂේත්‍ර" ආයතනයෙන් භරත නර්තන සම්ප්‍රදායය ප්‍රගුණ කළා ය. පසු කාලයේ දී භරත නාට්‍ය ශිල්පිනියක වශයෙන් ද ප්‍රසිද්ධියට හා ජනප්‍රියත්වයට පත් වූවා ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රථම නර්තන අධ්‍යක්ෂිකා ධුරය දැරූ මෙතුමිය පුසමාහිත පෞරුෂයක් ඇති දරු පරපුරක් බිහි කිරීම උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළා ය. ඒ අතර සමස්ත ලංකා නැටුම් තරග ක්‍රමවත් ව ආරම්භ කිරීම මෙන් ම අධ්‍යාපන අමාත්‍යාංශයේ නර්තන කණ්ඩායමක් බිහි කිරීමත්, නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනයට ඇය කළ විශිෂ්ට මෙහෙයකි.

ගිරාගම ගුරු අභ්‍යාස විද්‍යාලයයේ හා කටුකුරුන්ද ගුරු අභ්‍යාස විද්‍යාලයයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක වශයෙන් කටයුතු කළ ඇය තමන්ගේ ශිල්ප ඥානය ගුරු සිසුන්ට ලබා දුන්නා ය.

ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යක්ෂ ධුරය හෙබවූ ඇය පාසල් අධ්‍යාපනය තුළ සෞන්දර්ය විෂය, යුගයේ අවශ්‍යතාවට ගැළපෙන අයුරින් සංවර්ධනය කිරීමට ද දායක වූවා ය. ඒ අතර, ගුරු අත්පොත් සකස් කිරීම, විෂයමාලා සකස් කිරීම, ගුරු මාර්ගෝපදේශ සැකසීම, දුරස්ථ ගුරු පුහුණු, නර්තන සම්මන්ත්‍රණ පැවැත්වීම ආදි සේවාවන් රැසක් ක්‍රියාත්මක කළා ය. එමෙන් ම, ඇය විසින් අ.පො.ස. සා.පෙළ හා උසස් පෙළ ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා ප්‍රායෝගික ඇගයීම් කටයුතු විධිමත් ලෙස සකස් කරවන ලදි.

නර්තනය පිළිබඳ පොත්පත් හා ලිපි ගණනාවක් රචනා කළ මෙතුමිය දක්ෂ ලේඛිකාවක ලෙස ද දෙස් විදෙස් ගෞරවාදරයට ද පාත්‍ර වූවා ය.

මෙතුමිය විසින් ආරම්භ කරන ලද " මිරැන්ඩා හේමලතා කලා ආශ්‍රමය " දේශීය නර්තනය මෙන් ම භරත නැටුම් පිළිබඳ ව හැදෑරීමට දේශීය දරුවන්ට තෝතැන්නකි. සංචාරී චලන, රංගධාරා, රංග රේඛා, නූපුරරාවය ආදි නර්තන ප්‍රසංග ද " තණ්හා ආශා" යන ඉඟිනැටුව ද නිර්මාණය කළ ඇය 1980 වර්ෂයේ දී මෝල්ගස් නැටුමට නවරංග රටා නිර්මාණය කරමින් ජනප්‍රියත්වයට පත් කිරීමට ද එය සමත් වූවා ය.

මන්ද මානසික දරුවන්ගේ නර්තන කුසලතා ඔප් නැංවීම සඳහා ඔවුන්ට නර්තනය උගන්වා, එම දරුවන් සමාජගත කිරීමේ මහඟු මෙහෙවරක් ශ්‍රී ලංකාව තුළ පළමු වරට ආරම්භ කිරීමේ ගෞරවයෙන් ද ඇ පිදුම් ලබන්නී ය.

1985 දී සොන්ටා ජාත්‍යන්තර සම්මානය, 1988 දී කලාසූරි ජනාධිපති සම්මානය, ජාත්‍යන්තර කාන්තා දින සම්මානය ආදි සම්මාන රැසක් හිමි කර ගෙන ඇත. ඒ අතර සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයයේ නර්තන හා නාට්‍ය කලා පීඨය මඟින් නිර්දේශිත ව ඇගේ සේවය ඇගැයීම් කර ඇයට දර්ශන සූරි උපාධිය ද පිරිනමන ලදි.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)